# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

## ස්ථිර කාර්ය මණ්ඩල ඇබෑර්තු

### අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

**වෛද්‍ය පීඨය**

**සායනික විද්‍යා අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය

**සම සායනික විද්‍යා අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය

**ඉංජිනේරු පීඨය**

**විදුලි, විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ)
2. උපදේශක තනතුර - II ශ්‍රේණිය

**ගගන ඉංජිනේරු අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ), කථිකාචාර්ය තනතුර (පරිවාස)

**කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය**

**සමාජ විද්‍යා අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ), කථිකාචාර්ය තනතුර (පරිවාස)

**භාෂා අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ), කථිකාචාර්ය තනතුර (පරිවාස)

### දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

**නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා පීඨය**

**ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයනාංශය**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ), කථිකාචාර්ය තනතුර (පරිවාස)

*** විශේෂ සටහන - ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක් සහිත අපේක්ෂකයින් හට ප්‍රමුඛතාවයදෙනු ලැබේ.**

**ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය**

1. ඉංග්‍රීසි භාෂා උපදේශක තනතුර - III ශ්‍රේණිය

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය

1. තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) තනතුර III ශ්‍රේණිය
2. තාක්ෂණික නිලධාරී (සිවිල්) තනතුර III ශ්‍රේණිය
3. තාක්ෂණික නිලධාරී (විදුලි) තනතුර III ශ්‍රේණිය
4. තාක්ෂණික නිලධාරී තනතුර - II ශ්‍රේණිය (ආ) කාණ්ඩය

**වැටුප් පරිමාණ**

| | |
|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර I ශ්‍රේණිය | :- U-AC 3 (I) රු. 91,310 - 7x2,170 - 106,500 p.m. + (151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර II ශ්‍රේණිය | :- U-AC 3 (II) රු. 79,360 - 11x1,630 - 97,290 p.m. + (151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 3. කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ) | :- U-AC 3 (III) රු. 69,580 - 5x1,630 - 77,730 p.m. + (131% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 4. කථිකාචාර්ය තනතුර (පරිවාස) | :- U-AC 3 (IV) රු. 54,600 - 10x1,335 - 67,950 p.m. + (115% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 5. උපදේශක තනතුර II ශ්‍රේණිය | :- U-AS 1 (I) රු. 48,385 - 19x690 - 61,495 p.m. + (වෙනත් අනුමත දීමනා) |
| 6. ඉංග්‍රීසි භාෂා උපදේශක තනතුර - III ශ්‍රේණිය | :- U-AS 1 (II) රු. 41,095 - 18x660 - 52,975 p.m. + (වෙනත් අනුමත දීමනා) |
| 7. තාක්ෂණ නිලධාරී තනතුර III ශ්‍රේණිය/ තාක්ෂණ නිලධාරී තනතුර II ශ්‍රේණිය (ආ) කාණ්ඩය | :- U-MT 1 (IIIA) රු. 31,625 - 07x300;10x355 - 37,275 p.m. + (වෙනත් අනුමත දීමනා) |

**වෙනත් ප්‍රතිලාභ**

සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු, අධ්‍යයන දීමනා සහ පර්යේෂණ දීමනාව, සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය, විශ්‍රාම පාරිතෝෂික දීමනාව, නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලෙහි ප්‍රතිකාර ලබාගැනීමේ දී ප්‍රමුඛතාවය, සුඛසාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද.

**පොදු කොන්දේසි - සියළුම කාර්ය මණ්ඩලය සඳහා**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරා ගැනීම, ඒ ඒ තනතුරෙහි/ ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වන තෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරනු ඇත.
3. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකවල සහතික කළ ඡායා පිටපත් සහිතව **2022 අගෝස්තු මස 31** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම හෝ මෙහි සඳහන් විද්‍යුත් ලිපිනයට **(staffrecruit@kdu.ac.lk)** ස්කෑන් පිටපත් සහිතව යොමු කිරීම කළ යුතුය.
4. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. විද්‍යුත් තැපෑල මගින් අයදුම්පත් යොමු කිරීමේ දී විෂයය තීරුවෙහි අයදුම්කරන තනතුර සහ අධ්‍යනාංශය පැහැදිලිව සඳහන් කළ යුතුය.
5. අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
6. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.
7 කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 06 හි ලබා දී ඇති උපදෙස් අනුගමනය කර නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.
8. තෝරා ගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරි කිරීමට හැකියාව තිබිය යුතුය.
9. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.
10. අයදුම්කරුවන් තෝරා ගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සහ/ හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ඇත.
11. අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
12. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප ගෙවනු ලබන අතර, වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි - අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා**

1. අධ්‍යයන තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් සිය ඉගැන්වීමේ හැකියාව ඔප්පු කර පෙන්වනු පිණිස තේරීම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කළ යුතුය.
2. තනතුරුවලට අදාළ විෂය ක්ෂේත්‍රයන් සඳහා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය ද **(www.kdu.ac.lk)** සහ සුදුසුකම් සඳහා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 721, 08/2016, 08/2016 (ii), 08/2016 (iii), 07/2018, 725, 14/2017 සහ ඒවායේ විශේෂ සටහන් සහ අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස්දෙනු ලැබේ.

**පොදු කොන්දේසි - ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය සඳහා**

1. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 763 සහ 05/2022 වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස්දෙනු ලැබේ.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
ලේඛකාධිකාරී,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,
රත්මලාන 10390, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපෑල : staffrecruit@kdu.ac.lk

අවසන් දිනය
**2022 අගෝස්තු 31**

වැඩි විස්තර සඳහා
පිවිසෙන්න
www.kdu.ac.lk